# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1987 අංක 18 දරන නගර සභා (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1987 අප්‍රේල් මස 16 වන දින]

**ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.**

---

1987 අප්‍රේල් මස 16 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් **පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිල : ශත 45 යි

තැපැල් ගාස්තුව : ශත 75 යි

**1987 අංක 18 දරන නගර සභා (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 1987 අප්‍රේල් මස 16 වන දින]

එල්. ඩී.—ඕ. 14/80. (vi)

**නගර සභා ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 1987 අංක 18 දරන නගර සභා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — කෙටි නාමය.

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) නගර සභා ආඥාපනතේ 36 වන වගන්තියේ (ඹ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන ඡේද ඇතුළත් කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 255 වන අධිකාරයේ 36 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ඹඹ) (i) නගරයේ ගොඩනැගිලි, ගෘහභාණ්ඩ, ක්‍රීඩාභූමි නේවාසිකාගාර, ගුරු නිල නිවාස, ක්‍රීඩා උපකරණ සහ පුස්තකාල පහසුකම් වැනි අධ්‍යාපන පහසුකම් සැපයීම සඳහා වූ වැඩ සටහනක් පිළියෙල කර උචිත බලධරයා වෙත ඉදිරිපත් කිරීම;

(ii) නගරයේ පාසැල් විවෘත කිරීම, වසා දැමීම, ඒකාබද්ධ කිරීම, නම් කිරීම සහ උසස් කිරීම සම්බන්ධයෙන් උචිත බලධරයාට නිර්දේශ කිරීම;

(ඹඹඹ) නගරය පිහිටා ඇත්තේ යම් පරිපාලන දිස්ත්‍රික්කයක සීමා ඇතුළත ද ඒ පරිපාලන දිස්ත්‍රික්කය සඳහා පිහිටුවන ලද සංවර්ධන සභාව විසින් නගර සභාව වෙත පවරන ලද යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් ක්‍රියාත්මක කිරීම; කිරීම සහ ඉටු කිරීම සහ ක්‍රියාත්මක කිරීම; තවද ඒ සංවර්ධන සභාව විසින් නගර සභාව වෙත භාර කරන ලද යම් යෝජනා ක්‍රමයක් හෝ වැඩක් ක්‍රියාවේ යෙදීම;".

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 157 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 157 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ වගන්තියේ (9) වන ඡේදයේ (ප) අනුඡේදයට ඉක්බිතිව, පහත දැක්වෙන අනුඡේදය ඇතුළත් කිරීමෙන්:—

"(පප) කර්මාන්ත අපද්‍රව්‍ය විධිමත් කිරීම සහ පාලනය කිරීම;";

(ආ) ඒ වගන්තියේ (10) වන ඡේදයේ (ඇ) අනුඡේදයෙහි "ඒ ස්ථානවල රඳවා තැබීම" යන වචන වෙනුවට, "ඒ ස්ථානවල රඳවා තැබීම සහ ගව ආදී සතුන් සහ බල්ලන් එන්නත් කිරීම සහ ප්‍රතිශක්තිකරණය සඳහා පහසුකම් සැපයීම" යන වචන ආදේශ කිරීමෙන්; සහ

2—ඒ 094627—7,360 (86/12)

(ඇ) ඒ වගන්තියේ (14අ) ඡේදයට ඉක්බිතිවම, පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන්—

" (14ආ) වෙරළබඩ මසුන් ඇල්ලීමට ඇති බාධක ඉවත් කිරීම. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 159 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 159 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි (ඈ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේද ඇතුළත් කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

" (ඈඈ) දිළිඳු ජනයාට සහනය ලබාදීම, අනාථ තැනැත්තන් හෝ ශාරීරික වශයෙන්, මානසික වශයෙන් හෝ සැමාජීක වශයෙන් ආබාධිත තැනැත්තන් පුනරුත්ථාපනය කිරීම සහ ඔවුන්ගේ රැකවරණය, ප්‍රජා සංවර්ධනය ව්‍යාපෘති හෝ සේවා නියුක්ත වැඩ සටහන් සඳහා සභාව විසින් සම්මත කරන ලද සියලු ආධාර මුදල් ;

(ඈඈඈ) ආගමික චාරිත්‍රවිධි සහ උත්සව සංවිධානය කිරීම, දහම් පාසල් සහ ශාසනාරක්ෂක මණ්ඩල පවත්වාගෙන යාම, සංස්කෘතික මධ්‍යස්ථාන පිහිටුවීම, සාහිත්‍ය සහ සංස්කෘතික උත්සව සංවිධානය කිරීම, සාහිත්‍ය සහ සංස්කෘතික වටිනාකමින් යුත් පොත් ප්‍රකාශනය කිරීම සහ කලාකරුවන්ට, ග්‍රන්ථ කර්තෘවරුන්ට සහ ශිල්පීන්ට ත්‍යාග ප්‍රදානය කිරීම පිළිබඳ වියදම් සඳහා වූ ආධාර මුදල් ඇතුළුව ආගම සහ සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීමෙහිලා සභාව විසින් සම්මත කරන ලද සියලු ආධාර මුදල් ; ".

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.